JMC vLearning
"your virtual learning partner"

# මූලික සමාගම් නීතිය

කපිල ගාමිණී

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## මූලික සමාගම් නීතිය

ශ්‍රී ලංකාවේ සමාගම් පිළිබඳ නීතිය සළකා බැලීමේදී මෙරට ලියාපදිංචි වී ඇති සමාගම් සංඛ්‍යාව පිළිබඳව හැඟීමක් ඇතිකර ගැනීම පළමුව වැදගත් වේ. ඒ අනුව කරුණු විමසා බැලීමේදී 2006 ඔක්තෝම්බර් මාසය වන විට මෙරට ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 62,500 කට අධික සංඛ්‍යාවක් වූ බව අනාවරණය වේ. ඒ අතරින් 56,482 ක් තනි පුද්ගල සමාගම් වූ අතර, පොදු සමාගම් 2,642 ක් විය. මේ සියලු සමාගම් අතරින් 20,000 කට අධික සමාගම් සංඛ්‍යාවක් ඒ වනවිට අක්‍රීය තත්ත්වයකට පත්ව ඇතැයි 1982 අංක 17 දරණ පැරණි සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා එවකට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයේදී වැඩිදුරටත් අනාවරණය විය.

**1982 අංක 17 දරණ පැරණි සමාගම් පනත සංශෝධනය කිරීමට බලපෑ සාධක**

සමාගම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට දිගු ඉතිහාසයක් ඇතත් සියලුම නීතිරීති රෙගුලාසි එකට කැටිකර ගත් අංග සම්පූර්ණ නීති සංග්‍රහයක් ලෙස සමාගම් වලට අදාළ නීතිය ඉදිරිපත් වූයේ 1982 අංක 17 දරණ 89සමාගම් පනත මගිනි.

එහෙත් මීට වසර 25 කට පමණ පෙර පනවන ලද මෙකී පනතේ ව්‍යුහය හා ඇතැම් කරුණු වර්තමාන වාණිජ ලෝකයට අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට හා ව්‍යාපාර ඇරඹීමට මෙන්ම ආරවුල් නිරවුල් කිරීමට ද නොගැලපෙන බවට මත පළවිය. 1982 අංක 17 දරණ පැරණි සමාගම් පනත පදනම්ව තිබුණේ 1948 බ්‍රිතාන්‍ය සමාගම් ආඥා පනත මතයි. එම ආඥා පනතට සුළු වෙනස්කම් කිහිපයක් පමණක් සිදුකරන ලදී. ඉපැරණි මෙම නීති තත්ත්වය නවීන ක්‍රමවේදයට අනුරූපව සංශෝධනය විය යුතු බවට මතුව ආ තර්කවල විකල්පයක් නැති විය.

එසේම මෙම පනත් කෙටුම්පත සම්බන්ධ පාර්ලිමේන්තු විවාදයේදී අනාවරණය වූ කරුණක් වූයේ ඉක්මනින් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි රටවල් අතර එවකට ශ්‍රී ලංකාවට හිමිව තිබුණේ 87 වන ස්ථානය බවයි. ලෝක බැංකුව විසින් රටවල් 175 ක් අරබයා කරනු ලැබූ සමීක්ෂණයකදී මෙම තත්ත්වය හෙළිදරව් වී තිබිණ. ඉක්මණින් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි රටවල් අතර පළමුවන ස්ථානය සිංගප්පූරුවට ද, දෙවන ස්ථානය නවසීලන්තයට ද, තුන්වන ස්ථානය ඇමරිකා එක්සත් ජනපදයට ද හිමිව තිබිණි.

ශ්‍රී ලංකාවට වඩා ඉහළින් ඇෆ්ගනිස්ථානය වැනි නිරන්තර ගැටුම් පවතින රටක් ද තිබූ බවට ද මෙහිදී හෙළිවිය. මේ තත්ත්වය මත සමාගම් පනත සංශෝධන කිරීමේ ප්‍රධානතම අරමුණක් වූයේ කිසියම් පුද්ගලයෙකුට පහසුවෙන් සමාගමක් ඇරඹීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීමයි. එනම් සරල බවක් ඇති කිරීමයි. ඒ තුළින් විදේශ ආයෝජන ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමත්, රැකියා අවස්ථා වැඩි කිරීමත් ව්‍යවස්ථාදායකයේ අරමුණ විය.

## සමාගමක නෛතික පුද්ගලභාවය

සමාගමක මූලික ලක්ෂණයක් වන්නේ එහි ඇති සාමාජිකයන්ගෙන් වෙන්ව පෙනෙන නීතිමය ආස්ථිත්‍යභාවය හෙවත් නෛතික පුද්ගලභාවයයි. මින් අදහස් කෙරෙන්නේ සමාගමක් වෙනම නීතිමය පුද්ගලයෙකු ලෙස සැලකෙන බවයි. තවත් ආකාරයකින් කිවහොත් සමාගමකට කෘත්‍රිම පුද්ගලභාවයක් ඇත. එය එසේ හඳුන්වනු ලබන්නේ ස්වභාවික පුද්ගලයන් හෙවත් සාමාන්‍ය පුද්ගලයන් (මිනිසුන්) අතරින් වෙනස් කොට දැක්වීම සඳහාය. මෙම තත්ත්වය පැහැදිලිව තීරණය වූ නඩුවක් ලෙස **සලමන් එදිරිව සලමන් සහ සමාගම (1897) AC 22 සාමි මන්ත්‍රී මණ්ඩල තීන්දුව හැඳින්විය හැක.**

මෙම නඩුවේදී සලමන් නමැති පුද්ගලයා තම බිරිඳ, දියණිය හා පුතුන් සිව්දෙනා සමග සමාගමක් බිහි කළේය. ඔහුගේ පවුලේ මෙම සාමාජිකයන් එක බැගින් කොටස් දරමින් තම ව්‍යාපාරය මෙම සමාගමට විකුණා කොටස් 20,000/- ක් එකක් පවුම් එක බැගින් වන ලෙස ලබාගත් අතර, එහි වටිනාකම සඳහා 10,000/- ක් වටිනා ණයකරයක් (Debenture) ලබාගත්තේය. ඉන්පසුව සමාගම වැසී ගිය අතර, මෙම නඩුවේදී ප්‍රශ්නගත වූ කරුණ වූයේ සලමන් යනු ඔහුගේ සමාගමෙන් වෙනස්


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

වෙනත් අයෙකු ද යන්නත්, ඔහුගේ ඍණකර දැරීම අනික් කොටස්කරුවන් අභිබවා වලංගු ලෙස සිදුවේ ද යන්නත්ය. සාමි මන්ත්‍රී මණ්ඩලය තීරණය කළේ සලමන් යනු සමාගමෙන් වෙන් වූ පුද්ගලයෙකු බවත්, එබැවින් ආරක්ෂිත ණයහිමියෙකු ලෙස සලමන්ගේ පෙනී සිටීම වලංගු සහගත වන බවත්ය.

සමාගමක නෛතික පුද්ගලභාවයට අදාළ මෙම න්‍යාය තවදුරටත් පැහැදිලි කරන නඩුවක් ලෙස **ලී එදිරිව ලීස් එයාර් ආර්මික් ලිමිටඩ් (1961) AC 12** ප්‍රිවි කවුන්සිල තීන්දුව හැඳින්විය හැකිය. මෙහිදී ගුවන් නියමුවකු වූ ලී ගුවන් යානා පාලනය පිළිබඳ සමාගමක් පිහිටුවීය. එහි සියලු කොටස් ඔහුට අයත් වූ අතර, එම සමාගමේ කළමනාකාර අධ්‍යක්‍ෂකවරයා වූයේ ද ලී ය. කම්කරු වන්දි පනත යටතේ ඔහු ඔහුගේ සේවකයින්ට රක්‍ෂණ ආවරණය ලබාදී තිබිණ. ලී හදිසියේ අනතුරකින් මිය ගිය විට ඔහුගේ බිරිඳ වන්දි ඉල්ලා සිටියාය. මෙහිදී අධිකරණය තීරණය කළේ ලී සහ ඔහුගේ සමාගම එකිනෙකින් වෙනස් නෛතික පුද්ගලයින් බැවින් ද, ඔහුට කළමනාකාර අධ්‍යක්‍ෂ ලෙස ගුවන් නියමුවෙකු වන තමාට ද උපදෙස් දිය හැකිව තිබූ හෙයින් ඔහුත්, සමාගමත් අතර සේව්‍ය-සේවක බාධාවක් නොතිබූ නිසා ඔහුගේ බිරිඳට වන්දි ලබාගත හැකි බවයි.

ව්‍යවස්ථා සහ අධිකරණ ඇතැම් අවස්ථා වලදී සංස්ථාපිත පුද්ගලයන් පිටුපස සිටින සැබෑ පුද්ගලයන් සොයා යෑමට පෙළඹෙනු දක්නට ලැබේ. මෙම ක්‍රියාවලිය හැඳින්වෙන්නේ සංස්ථාගත කිරීමේ කඩතිර හැරීම නැතිනම් සමාගම් දැල කඩතුරාව ඉවත් කිරීම යනුවෙනි. මේ සම්බන්ධයෙන් **සුක්කුව් සිං බගතරන් (1975) ඩබ්ලිව්.එල්.ආර්. 483** නඩුවේදී අධිකරණ මෙසේ තීන්දු කරන ලදී.

"ඒජන්තවරයෙකුට ප්‍රධානියාගෙන් වෙන් වූ නෛතික පුද්ගලභාවයක් ඇතැයි කිවහොත් කිසිවකු එය ප්‍රතික්ෂේප නොකරනු ඇත. එසේම ඒජන්තවරයෙකු හෙවත් නියෝජිතයෙකු ප්‍රධානියාගේ නියෝග වලට භාජනය වීම යනු ඔහුට වෙනම නෛතික පුද්ගලිකත්වයක් නැතිවීම නොවේ. එලෙසින්ම සංස්ථාවකට තමන්ට වෙන් වූ පුද්ගලභාවයක් තිබූ පමණින්ම එය රජයේ ඒජන්තකමක් දැරීමට බාධාවක් විය නොහැකිය. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිමය ගැටලු වලදී රජයේ පාලනයට යටත් සංස්ථා නියෝජිතභාවයක් උසුලන්නේ නැති බවට කිව නොහැකිය."

මෙය ඒජන්ත සහ වල්මර්ගෝ (අඹ යහළු) වාදය මූලධර්මය ලෙස හැඳින්වේ. එහි හරය වන්නේ සමාගමක් වෙන් වූ නෛතික පුද්ගලයෙකු වුවද ඇතැම්විට එය ප්‍රධාන මව් සමාගමේ හෝ වෙනත් පාලන සමාගමක නියෝජිතයෙකු ලෙස සැළකිය හැකි බවයි.

## 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ හැකි සමාගම් වර්ග

නව පනතේ 3(1) වගන්තියට අනුකූලව ප්‍රධාන වශයෙන් සමාගම් වර්ග 03 ක් මෙම පනත යටතේ ලියාපදිංචි කළ හැකි බව දැක්වේ.

1. සීමාසහිත සමාගම්
2. සීමාරහිත සමාගම්
3. ඇපයෙන් සීමිත සමාගම්

### සීමාසහිත සමාගම්

මෙම සමාගම් නිශ්චිත වත්කම් වලට කොටස්හිමියන්ට වගකීමක් ඇති කොටස් නිකුත් කරන සමාගම් ලෙස හඳුනාගත හැකිය.

### සීමාරහිත සමාගම්

මෙම සමාගම් සම්බන්ධයෙන් සළකා බලන කළ සමාගමේ වත්කම් වලට දායක වීමට කොටස්හිමියන්ට සීමාරහිත වගකීමක් ඇති බව පෙනේ. එසේම මෙම සමාගම් ද කොටස් නිකුත් කරයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ඇපයෙන් සීමිත සමාගම්

සමාගම ඈවර කිරීමට සිදු වූ අවස්ථාවක සමාගමේ ව්‍යවස්ථාවලියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයකින් එහි වත්කම් වලට දායක වීමට සාමාජිකයන් භාරගන්නා සමාගම් මේ නමින් හැඳින්වේ. **මෙම සමාගම් කොටස් නිකුත් නොකරන අතර**, මේ සඳහා නව සමාගම් පනතේ III වන කොටසේ විධිවිධාන අදාළ වේ.

2007 අංක 07 දරණ නව සමාගම් පනතේ 3(2) වගන්තිය අනුව සීමාසහිත සමාගම් පුද්ගලික සමාගම් සහ අක්වෙරළ සමාගම් වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. පුද්ගලික සමාගම් සම්බන්ධයෙන් නව පනතේ II වන කොටසේ විධිවිධාන බලපාන අතර, අක්වෙරළ සමාගම් සම්බන්ධයෙන් නව පනතේ XI කොටසේ විධිවිධාන බලපායි.

පෞද්ගලික සමාගම් සම්බන්ධව නව පනතේ 27 සිට 31 දක්වා වගන්ති අදාළ වේ. පෞද්ගලික සමාගමක ව්‍යවස්ථාවලියේ සමාගම විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ වෙනත් සුරැකුම්පත් මහජනයාට අර්පණය කිරීම එම සමාගමට තහනම් කරන සහ සමාගමේ සේවා නියුක්තයන් හෝ එම සමාගමේ සේවා නියුක්තයන්ව සිටියදී සමාගමේ කොටස්හිමියන් බවට පත් වුවද සමාගමේ සේවා නියුක්තයන්ව සිටීම අවසන් කිරීමෙන් පසු කොටස්හිමියන් ලෙස දිගටම සිටින සමාගමේ කලින් සිටි සේවා නියුක්තයන් වන කොටස්හිමියන් ඇතුළත් නොවන එහි කොටස්හිමියන් සංඛ්‍යාව 50 කට සීමාකරන විධිවිධාන ඇතුලත් විය යුතුය.

නව පනතේ 28 වන වගන්තියට අනුව පෞද්ගලික සමාගමක් විසින් එහි ව්‍යවස්ථාවලිය 27 වන වගන්තියේ නියමයන්ට තවදුරටත් අනුකූලව ක්‍රියා නොකරන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබුවහොත් ඒ සමාගම පෞද්ගලික සමාගමක් වීම අවසන් විය යුතු බව දැක්වේ.

නව පනතේ XI කොටසේ **අක්වෙරළ සමාගම්** සම්බන්ධ විධිවිධාන අන්තර්ගත වේ. එහි 260 වන වගන්තියට අනුව යම් විදේශීය රටක නීති යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් හෝ සංස්ථාගත මණ්ඩලයක් මේ ගණයට වැටේ. 261 වන වගන්තියේ දැක්වෙන්නේ ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු සඳහා සංස්ථාගත කරන ලද සමාගම් එය මේ පනතේ විධිවිධාන යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වුවාක් මෙන් ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරනු ලැබූ ලෙස සලකනු ලැබීමට ද ඒ සමාගම විසින් මේ පනතේ මෙම කොටසේ විධිවිධාන වලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කළ හැකි බවයි. පනතේ 264 වන වගන්තියේ දැක්වෙන ආකාරයට යම් ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවෙන් පිටත කරගෙන යාමේ බලය අක්වෙරළ සමාගමකට ඇති අතර, ශ්‍රී ලංකාව ඇතුළත යම් ව්‍යාපාරයක් කරගෙන යාමට හිමිකම ඊට නොමැත්තේය. එහෙත් 264 වන (2) වගන්තියේ දැක්වෙන ඉහත කී වගන්තිය නිසා අක්වෙරළ සමාගමකට අදාළ කරගත හැකි යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවේදී ලබාගත හැකි යම් ප්‍රතිලාභයක් හෝ වාසියක් අත්කර ගැනීමට බාධාවක් නොවිය යුතු බවයි. මෙවැනි අක්වෙරළ සමාගමක් වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කිරීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව නියමිත ආකෘතියට අනුකූලව දැන්වීමක් සමාගමේ රෙජිස්ට්‍රාර්වරයාට භාරදීමෙන් එය ඉටු කරගත හැකිය.

## නව පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය

1982 අංක 17 දරණ පැරණි සමාගම් පනත යටතේ පුද්ගලික සමාගමක්, පොදු සමාගමක් හා ජනතා සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා පිළිවෙලින් අවම වශයෙන් පුද්ගලයින් 2, 7 හා 50 දෙනෙක් සිටිය යුතුය. එහෙත් 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ 4 හා 5 වගන්ති වලට අනුකූලව තනි පුද්ගලයෙකුට වුවද සමාගමක් පිහිටුවිය හැකිය. පැරණි පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සාංගමික සංස්ථා පත්‍රයක් (Memorandum of Association) සහ සාංගමික ව්‍යවස්ථාවලියක් (Memorandum of Articles) අවශ්‍ය වේ. එහෙත් නව සමාගම් පනතේ 486 (2) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන්නේ සාංගමික සංස්ථාවලිය පමණි. එම වගන්තියේ වැඩිදුරටත් දැක්වෙන ආකාරයට දැනට පවතින සමාගමක සාංගමික සංස්ථාපත්‍රය එම සමාගමේ ව්‍යවස්ථාවලියේම කොටසක් වශයෙන් සළකනු ලැබිය යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

නව සමාගම් පනතේ 4 සහ 5 වගන්තිවලට අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සමාගමේ එක් එක් ආරම්භක කොටස්හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියේ වූ ඉල්ලුම් පත්‍රයක් සහ මතු දැක්වෙන ලේඛනය ද ඉදිරිපත් කළ යුතුය.

1. 4(1) අ - නව සමාගමේ නම දැනට පවතින සමාගමක නමට සමාන නොවන බව සඳහන් ප්‍රකාශය.
2. 4(1) ආ - සමාගමේ එක් එක් ආරම්භක කොටස්හිමියන් විසින් අත්සන් කරන ලද සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය.
3. 4(1) ඇ - පනතේ 203 වගන්තිය යටතේ ආරම්භක අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගත් කැමැත්ත.
4. 4(1) ඈ - මේ පනතේ 221(2) උපවගන්තිය යටතේ ආරම්භක සමාගම් ලේකම්වරයාගේ කැමැත්ත.

4(2) උපවගන්තියේ දැක්වෙන පරිදි සමාගමක කොටස්හිමියන් 02 කට වඩා අඩුවෙන් නොසිටිය යුතුය. එහෙත් කොටස්හිමියා ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් කොටස් දරණ භාණ්ඩාගාර ලේකම් හෝ පුද්ගලයෙකු හෝ සංස්ථාවක් වන විටෙක සමාගමක තනි කොටස්හිමියෙකු සිටිය හැකිය.

නව පනතේ 5 වැනි වගන්තියට අනුව ඉහත කී පරිදි සංස්ථාගත කිරීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද නියමිත ආකෘතියේ වූ ඉල්ලීමක් ලැබුණු විටෙක සමාගම් රෙජිස්ට්‍රාර් විසින් එම සමාගම පිළිබඳ විස්තර සමාගම් රෙජිස්ටරයේ ඇතුලත් කළ යුතු අතර, සමාගමට අංකයක් ලබාදීම හා සංස්ථාගත කිරීමේ සහතිකයක් නිකුත් කිරීමට පියවර ගත යුතුය. එම සහතිකයෙහි සමාගමේ නම, අංකය, සමාගම සංස්ථාගත කරන ලද දිනය, වර්ෂය නිශ්චිතව සඳහන් විය යුතුය.

## සාංගමික ව්‍යවස්ථාවලිය

නව සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීමේදී අත්‍යාවශ්‍ය වන සාංගමික ව්‍යවස්ථාවලිය පිළිබඳ විධිවිධාන අන්තර්ගත වන්නේ නව පනතේ 13 වන වගන්තියෙහිය. එහි දැක්වෙන පරිදි සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියෙහි නව පනතේ පළමුවන උපලේඛනය හැර එම පනතේ විධිවිධාන වලට අනුකූල නොවන යම් කාරණයක් සඳහා විධිවිධාන සැලැස්විය හැකි අතර, විශේෂයෙන්ම පහත දැක්වෙන කාරණා සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

1. සමාගමේ පරමාර්ථ
2. සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
3. සමාගමේ කළමනාකරණය හා පරිපාලනය

නව සමාගම් පනතේ 14 වන වගන්තියේ දැක්වෙන ආකාරයට එම පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති සාංගමික සංස්ථාවලිය ඇපයෙන් සීමිත සමාගමක් හැර යම් සමාගමක් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

### ව්‍යවස්ථාවලිය වෙනස් කරන්නේ කෙසේද?

මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ නව පනතේ 15 වන වගන්තියයි. 15(1) වගන්තියේ දැක්වෙන ආකාරයට සමාගමක ව්‍යවස්ථාවලිය වෙනස් කළ හැක්කේ නව පනතේ විධිවිධාන වලට සහ එකී ව්‍යවස්ථාවලියේ ඇතුලත් යම් කොන්දේසි වලට යටත්ව සමාගමේ කොටස්හිමියන්ගේ විශේෂ යෝජනා සම්මතයකිනි. එම වෙනසට අදාළ ලේඛන යෝජනා සම්මතයෙන් පසු වැඩ කරන දින 10 ක් ඇතුලත එම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමක් සමග සමාගමේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව ද පනතේ වැඩිදුරටත් දැක්වේ. ඉහත කී විධිවිධාන කඩකරන සමාගමක් වරදකට වරදකරු වන අතර, ඒ සඳහා රු. 50,000 ක් නොඉක්මවන දඩයකට යටත්විය යුතු බව 15(3) වගන්තියේ දැක්වේ. එසේම පැහැර හැරීම කරන ලද සමාගමේ සෑම නිලධාරියෙකුම එම වරදට වරදකරු වන අතර, දඩය රු. 50,000 කට නොවැඩි විය යුතු බවද එහි වැඩිදුරටත් දැක්වේ.

### ව්‍යවස්ථාවලියේ බලපෑම

නව පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව සමාගමක **ව්‍යවස්ථාවලිය මෙම පනතේ 89 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව එහි කොටස්හිමියන් සහ සමාගම අතර පවතින ගිවිසුමක් වේ.** එසේම එම ව්‍යවස්ථාවලියෙන් සමාගම සහ එහි කොටස්හිමියන් බැඳී සිටිති. විශේෂයෙන්ම ව්‍යවස්ථාවලිය


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

යටතේ යම් කොටස්හිමියෙකු විසින් සමාගමට ගෙවිය යුතු මුදල් කිසිවක් ඒ කොටස්හිමියාගෙන් සමාගමට අයවිය යුතු වන්නේය. පනතේ 17 වන වගන්තියේ දැක්වෙන්නේ ව්‍යවස්ථාවලියේ පරමාර්ථ පිළිබඳ ප්‍රකාශයේ බලපෑමයි. ව්‍යවස්ථාවලියේ පිටපතක් ලබාගැනීමට කොටස්හිමියන්ට අයිතිවාසිකමක් ඇති බව නව පනතේ 18 වන වගන්තියේ දැක්වේ.

## සමාගම් නාමය පිළිබඳ විධිවිධාන

2007 අංක 7 දරණ නව සමාගම් පනතේ 6 සහ 7 වගන්තිය මේ සම්බන්ධයෙන් අදාළ වේ. ඒ අනුව නිල ලැයිස්තුගත සමාගමක් හැර සෑම සීමාසහිත සමාගමක නමේ මුලට සීමාසහිත යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "සී/ස" යන්න යෙදිය යුතුය. එසේම සෑම පෞද්ගලික සමාගමකම නමේ මුලට සීමාසහිත යන වචනය හෝ යන්න හෝ එහි කෙටි යෙදුම "සී/ස" යන්න සහ අගට යෙදෙන සමාගම යන වචනයට පෙර පෞද්ගලික යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "පෞද්" යන්න යෙදිය යුතුය. නිල ලැයිස්තුගත සමාගමක් වන සෑම සීමාසහිත සමාගමක නමේ මුලට සීමාසහිත යන වචනය හෝ එහි කෙටි යෙදුම වන ''සී/ස'' යන්න සහ අගට යෙදෙන සමාගම යන වචනයට පෙර "පොදු" යන වචනය යෙදිය යුතුය.

නව සමාගම් පනතේ සමාගමකට යෙදිය හැකි නම් සම්බන්ධයෙන් සීමා කිරීම් අන්තර්ගත වන්නේ පනතේ 7(1) වගන්තියෙහිය. ඒ අනුව,

1. වෙනත් යම් සමාගමක හෝ ලියාපදිංචි කළ හෝ විදේශීය සමාගමක නමකට සෑම අතින්ම අනුරූප වන සමාන නමක් යෙදිය නොහැකිය.
2. සමාගමකට සීමාසහිත යන වචනය එකතු කිරීමකින් තොරව 34 වන වගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයක් යටතේ ලියාපදිංචි කිරීමට යෙදෙන සමාගමක් වන්නේ නම් මිස වාණිජ මණ්ඩලය යන වචනය යෙදිය නොහැකිය.
3. රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව නොමග යවන සුලු නමකින් කිසිදු සමාගමක් ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.
4. ජාතියේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව හැර කිසිම සමාගමක්,

 i. "ජනාධිපතිවරයාගේ හෝ ජනාධිපති" යන වචන හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ අයිතිය නැතහොත් ආණ්ඩුවේ හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සමග සබඳතාවක් ඇති බව හඟවන හෝ හැඟවීමට ඉඩ සැලසෙන වචන.

 ii. නාගරික හෝ සංස්ථාගත යන වචන හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව යම් මහ නගර සභාවක් හෝ වෙනත් පළාත් පාලන ආයතනයක් නැතහොත් පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරනු ලැබූ යම් සමිතියක් හෝ මණ්ඩලයක් සමග සබඳතාවක් ඇති බැව් හඟවන හෝ හැඟවීමට සලස්වන වෙනත් වචන,

 iii. සමූපකාරය හෝ සමිතිය යන වචන නැතහොත්,

 iv. "ජාතික, රාජ්‍ය හෝ ශ්‍රී ලංකා" යන වචන රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව රජය සමග හෝ යම් දෙපාර්තමේන්තුවක් සමග යම් සබඳතාවක් ඇති බව හඟවන හෝ හැඟවීමට ඉඩ සැලසෙන වෙනත් වචන අඩංගු වන නමකින් ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

## සමාගමක නමක් වෙනස් කිරීම

යම්කිසි සමාගමක නම් වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ නව පනතේ 8 වන වගන්තියයි. ඒ අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව සමාගමක් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් එහි නම වෙනස් කළ හැකිය. 8(2) වගන්තියේ දැක්වෙන්නේ එසේ නම වෙනස් කිරීමක සමාගමක් විසින් යෝජනා සම්මත කරගෙන ඇති විටෙක එකී වෙනස් කිරීමේ දිනයේ සිට වැඩකරන දින 10 ක් ඇතුලත ඒ වෙනස් කිරීම පිළිබඳ දැන්වීම නියමිත ආකෘතියකින් යුක්තව රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබාදිය යුතු බවයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd